# ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ
# ප්‍රවෘත්ති නිවේදනය
මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපැල: ohararm@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 20180202

**අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID)
තරුණයන් සඳහා වූ රැකියා හා කුසලතා සංවර්ධන වැඩසටහනක් මධ්‍යම පළාතේ දියත් කරයි.**

**කොළඹ, පෙබරවාරි 2, 2018**: මෙහි පැමිණ සිටින එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර ලේකම් ඩැනියෙල් රොසන්බ්ලූම් විසින් අද මහනුවර දී 'යූලීඩ්' (YouLead) කාර්යාලය විවෘත කරන ලදී. මේ මගින් මධ්‍යම පළාතේ තරුණයන් සඳහා රැකියා අවස්ථා වැඩි කරනු ඇත.

අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) මගින් අරමුදල් සපයන කුසලතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යංශය හා මධ්‍යම පළාතේ කර්මාන්ත හා වාණිජ මණ්ඩලය විසින් හවුලේ ක්‍රියාත්මක කරන මෙම (YouLead) ව්‍යාපෘතිය රුපියල් බිලියන 1.8 ( ඩොලර් මිලිය 12) ක වැඩසටහනකි. 2017 ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වඩා වෙළඳ පොළ නැඹුරු, කුසලතා සහිත නම්‍යශීලි ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමයි.

"ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය ආර්ථික වර්ධනය පවත්වා ගැනීම සඳහා වෙළඳපොළ ඉල්ලුමට ගැලපෙන ආකාරයේ සාර්ථක රැකියා සඳහා අවශ්‍ය වන කුසලතා තරුණයන්ට ලබා දිය යුතුය" යි රොසන්බ්ලූම් ප්‍රකාශ කළේය. "එක්සත් ජනපද රජය මෙම (You Lead) වැඩසටහන තුළින් ශ්‍රී ලංකා රජය, වාණිජ මණ්ඩල, ව්‍යාපාරික ප්‍රජාව හා කලාපයේ රාජ්‍ය හා පුද්ගලික පුහුණු ආයතන සමග දීර්ඝ කාලීන හා ඵලදායක සහයෝගිතාවක් ගොඩ නගා ගැනීමට අපේක්ෂා කෙරේ"

තරුණ විරැකියාව ඉතා උග්‍ර ලෙස දක්නට ලැබෙන මධ්‍යම, සබරගමුව, දකුණු හා උතුරු පළාත්වල මෙම (YouLead) වැඩසටහන ක්‍රියාත්මක වේ. වාණිජ මණ්ඩල කාර්යාලය තුළ පිහිටා ඇති මෙම (YouLead) ව්‍යාපෘතියේ මහනුවර කලාපීය කාර්යාලය, මධ්‍යම පළාතේ තරුණයින්ට රැකියා අවස්ථා වැඩිකිරීමටත් සහයෝගීතාවත් වර්ධනය කිරීමටත් වාණිජ මණ්ඩල සාමාජිකයන් මෙන්ම පෞද්ගලික හා රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන සමග ඉතා සමීපව කටයුතු කරනු ඇත.

අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) යනු එක්සත් ජනපද රජයේ ප්‍රධාන සංවර්ධන ආයතනයයි. 1956 වර්ෂයේ සිට එක්සත් ජනපද රජය විසින් ශ්‍රී ලංකාවට ඩොලර් බිලියන දෙකකට වැඩි ප්‍රමාණයක සංවර්ධන හා මානුෂීය ආධාර සපයා තිබේ.